**රණවිරු සේවා අධිකාරිය - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රණවිරු සේවා අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2019 වර්ෂයේදී තහවුරු කිරීම මත ගෙවීමට යටත්ව හඳුනාගත් ගිණුම් 3917කින් ප්‍රවර්ථන වර්ෂය අවසානයට මාපිය රැකවරණ දීමනා ලබන ගිණුම් 1800ක් පැවතුණු අතර ඒ පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 129(ඇ) (I) අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | මෙම වගකීම 2023 වර්ෂයේ සිට අසම්භාව්‍ය වගකීමක් ලෙස හෙළිදරවු කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |
| (ii) 2011 වසරේදී අධිකාරියෙන් ඉල්ලා අස්වන ලද පරිගණක සහකාර නිලධාරිණියකගෙන් අය විය යුතු රු. 530,380 ක මුදල අය කර ගැනිම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මගින් නඩුවක් ගොනු කර ඇති අතර ඒ පිළිබද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි පරිශිෂ්ය (ආ) අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ඉදිරියේදි එවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (iii) රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 13 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණ ඒවායෙහි සමාන ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය සමාන බව පදනම් කරගෙන කාණ්ඩ කර දැක්විය යුතු වුවද ඉඩම් හා ගොඩනැගිලි දේපල පිරියත වලින් වෙන්ව හඳුනාගෙන තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (i)මූල්‍ය ප්‍රකාශන තුල භාණ්ඩාගාර බිල්පත් මත පොළී ආදායම රු.5,372,849 ක් වශයෙන් හඳුනාගෙන ඇතත් භාණ්ඩාගාර බිල්පත් මත සඳහන් පොළී අනුපාතය මත ගණනය කල විට එහි සත්‍ය පොළී වටිනාකම රු.3,770,210 ක් වූයෙන් 2022 වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ආදායම සහ ආයෝජන වත්කම රු. 1,602,639 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම අඩුපාඩුව 2023 වර්ෂයේ දී කඩිනමින් නිවැරදි කිරීමටත්,ඉදිරියේදී එවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙසටත් අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | නිවැරදිව ගණනය කරන ලද පොළී ගිණුම්ගත කල යුතු වීම. |
| (ii) අධිකාරිය විසින් 2022 ජූනි මස 29 වන දින සිට ස්ථාවර තැන්පතුවක් මහජන බැංකුවේ ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන අතර එහි තැන්පතු පොළී ආදායම ගණනය කිරීමෙදී රු.396,364 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු පොලිය රු.396,364 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ නිවැරදි කිරීම් 2023 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරන බව දක්වන අතර,මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | වර්ෂයට අදාල පොළී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතු වීම. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) ජර්නල් වවුචර නොමැති වීම | **56,255,315** | එකතුව රු.56,255,315 ක් වූ ජර්නල් සටහන්වල නිවැරදිතාවය පිළිබඳව ජර්නල් වවුවරයක් මඟින් ගණකාධිකාරි විසින් සහතික කල යුතු වුවත් ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබීම හේතුවෙන් එම සහතික වීම කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ජර්නල් සටහන් සඳහා ජර්නල් වවුචර් පිළියෙළ කර අනුමත කිරීමෙන් පසු ගිණුම් තැබීමේ කටයුතු සිදු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | ජර්නල් සටහන් සඳහා ජර්නල් වවුචර් සකස් කර අනුමැතිය ලබාගත යුතු වීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී නිළධාරීන් දෙදෙනකු විසින් ලබා ගන්නා ලද රු 1,830,450 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන තුරුත් පියවා නොතිබුණි. ඒ සඳහා අදාල නිලධාරීන්ට විරුද්ධව විනය පරීක්ෂණ සිදුකර එම දෙදෙනාම නිවැරදි කරුවන්වීම හේතුවෙන් මෙම ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු අය හඳුනාගෙන නොතිබුණි. | නැවත විනය පරීක්ෂණයක් පවත්වන ලෙස ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් දන්වන ලදී. ඒ අනුව දෙවන වරටත් විනය පරීක්ෂණයක් පවත්වා අදාල වාර්තාව 2023/01/26 දින කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එය නැවත අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් නිර්දේශ කර නොමැත.<br>එමෙන්ම මෙම අත්තිකාරම් ලබාදීමට අදාල ලිපිගොනු අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව මගින් සිදු කරන විමර්ශනය වෙත යොමුකර ඇත. | අයවීමට ඇති මුදල් සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන කඩිනමින් මුදල් අයකර ගත යුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ අංක PED/12 චක්‍රලේඛයේ 9.12 වගන්තිය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා නොගෙන අග්‍රහාර රක්ෂණ වාරිකයේ අර්ධයක වැය බර ලෙස රු.131,000 ක් අධිකාරිය විසින් වැය කර තිබුණි | කළමණාකරණ මණ්ඩල අනුමත කරන ලද බැවින් මාසික වාරික මුදලින් 50% ක් අධිකාරිය විසින් ගෙවන ලදී. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අනුමැතිය ලබාදිය නොහැකි බව 2022 මැයි මාසයේ දන්වන ලද අතර එම මාසයේ සිට අධිකාරිය විසින් මෙම ගෙවීම නතර කර ඇත. | ගෙවීම් කිරීමට පෙර අවශ්‍ය අනුමැතියන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 121,972,695 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 19,846,298 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 102,126,397 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂ මුළු ආදයම රු.55,268,071 කින් අඩු වීමට වඩා හා මුළු වියදම රු.157,394,469 කින් අඩු වීම මෙම වර්ධනයට හේතු වී තිබිණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i)සන්නද්ධ හමුදාවල හා පොලිසියේ යුධමය ක්‍රියාන්විතයේදි ආබාධිත, මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්වල යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අධිකාරිය පිහිටුවා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් | රණවිරු සේවා අධිකාරිය විසින් දැනට නිර්මාණය කර ඇති දත්ත පද්ධතිය අධියර තුනක් යටතේ ක්‍රියාත්මක වේ. පළමු අධියර යටතේ ක්‍රියාන්විතයේදි මියගිය, අතුරුදහන් සහ ආබාධිත රණවිරුවන්ගේ ජීව දත්ත යාවත්කාලීන කරනු ලැබේ. දෙවන අධියර යටතේ ක්‍රියාන්විත හේතූන් මත මියගිය, අතුරුදහන් සහ ආබාධිත රණවිරුවන්ගේ යැපෙන්නන්ගේ තොරතුරු දිස්ත්‍රික් නිලධාරීන් | තොරතුරු පද්ධතිය නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| ආබාධිත, අතුරුදහන්වූවන් සහ මියගිය හෝ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව විධිමත් හා නිවැරදි තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | විසින් දත්ත පද්ධතියට ඇතුලත් කරමින් පවතින බව දන්වමි. තෙවන අධියර යටතේ ඉලක්කගත ප්‍රතිලාභීන්ට රණවිරු සේවා අධිකාරිය හා ඒ ඒ සේවාවන් වල සුභසාධක අංශ මගින් ලබාදුන්/ ලබා දෙනු ලබන ප්‍රතිලාභ ඇතුලත් කරමින් පවතින බව දන්වමි. | |
| (ii) 2014 වර්ෂයේදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙහි සිදුකරන ලද ක්ලැඩින් සවිකිරීම වෙනුවෙන් ටී.සී.අයි. (T.C.I ENTERPRISES PVT LTD) ආයතනයෙන් රඳවා ගන්නා ලද රු.224,063 ක මුදල ප්‍රවර්ථන වර්ෂය අවසන් වන තුරුත් නිදහස් කර නොතිබුණු අතර 2014 වසරේ රු.4,481,269 ක් වූ එම ගණුදෙනුව මත තිබූ අක්‍රමිකතා පිළිබඳ විමර්ශනයක් සිදුකර නොතිබුණි. | මේ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම වෙත භාර දී ඇත.2022 වර්ෂය අවසන් වන විටද මෙම කොන්ත්‍රාත්තුවට අදාළ විමර්ශන කටයුතු අවසන් නොවීම නිසා අදාළ රඳවා ගැනීමේ මුදල ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත. | අක්‍රමිකතාවයන් පිළිබඳ නොපමාව විමර්ෂණය කර පාඩු වීම් අවම කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii))ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා සම්පත හා හඳහන ලොතරැයි ආදායමෙන් 2022 වර්ෂයට අදාලව අධිකාරියට ලැබිය යුතු ආදායම රු.129,826,112 ක් වුවත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්මේන්තුව මගින් අධිකාරිය වෙත 2022 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණේ රු.10,193,960 ක් පමණි. ඒ අනුව රු.119,632,152 ක් ලැබිය යුතුව පැවතුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේ සිට නිසි පරිදි මුදල් නිදහස් නොකරන ලදී. මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී අධිකාරිය විසින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කළද අදාළ මුදල් නිසි පරිදි නිදහස් නොකිරීම නිසා අධිකාරියේ ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට නොහැකි වි ඇති බව දන්වමි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (iv) සමාලෝචිත වර්ෂය තුලදී ආබාධිත රණවිරුවන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් වෙත විවිධ සැත්කම් සඳහා වෛද්‍ය ආධාර ලෙස රු.1,870,770 ක මුදලක් පුද්ගලයන් 18 දෙනෙකු වෙත ගෙවා තිබුණි. මෙම ආධාර මුදල් වෛද්‍ය පහසුකම් සපයන ආයතනයට ගෙවීමේ ක්‍රමවේදයකින් තොරව අදාල පුද්ගලයන් වෙත සෘජුවම ලබාදී තිබුණි. ඒ පිළිබඳ පසු විපරමක් සිදු කර නොතිබුණු බැවින් ගෙවන ලද ආධාර මුදල් අදාල කාරණය සඳහා යොදවා ගෙන තිබුණු බවට විගණනයේදී තහවුරු නොවුණි. | 2023 වසරේ සිට ඉදිරියේදි සිදු කරන සැත්කම් සඳහා මුදල් ලබාදීමේදි අධිකාරිය වෙතින් ලබා දෙන ආධාර මුදල සෘජුවම අදාළ ආයතනය වෙත චෙක්පතකින් ලබා දීමට කටයුතු කරන බව දන්වමි. එසේම මෙම වර්ෂයේ සිට අධිකාරි විසින් ලබා දෙනු ලබන සියළුම ප්‍රතිලාභ පිළිබඳව පසු විපරම් සිදු කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව දන්වමි. | වෛද්‍ය පහසුකම් සඳහා ලබාදුන් මුදල් අදාල අරමුණට යොදාගත් බවට තහවුරු කර ගත යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ පූර්ණ නිවාස 1950 ක් සහ අර්ධ නිවාස 1700 ක් වැඩ අවසන් කිරීම වෙනුවෙන් රු.මිලියන 3192 ක් වෙන් කර තිබුණි. 2019 වර්ෂයේ වැඩ අවසන් කිරීමට නියමිත වුවත් 2022 දක්වා දීර්ඝ කර තිබුණු අතර 2022 | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා වාර්ෂිකව අවශ්‍ය ප්‍රතිපාදනයන් අඩුවෙන් ඇස්තමේන්තු කිරිමත්, ඇස්තමේන්තු කරන ලද මුදල ද එම අධිකාරියේ වෙනත් නිවාස ව්‍යාපෘති සඳහා යෙදවීම නිසාත්, ප්‍රතිලාභින්ගේ නිවාස ඉදිකිරිමට මුදල් නිසි පරිදි නිදහස් නොකිරීම නිසාත්, මූල්‍ය හා භෞතික කාර්යසාධනය අඩු මට්ටමක පැවතීමට හේතු විය. මේ සම්බන්ධයෙන් අවස්ථා | ලබාදෙන ලද මතභේදයට තුඩුදෙන ණය ආපසු ලබාගත යුතු වීම. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 වන විට මුළු ව්‍යාපෘති මුදලින් රු.මිලියන 1035.1 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ එක් වාරිකයක් හෝ ගෙවීම ආරම්භ කර ඇති සම්පූර්ණ නිවාස ගණන 1496 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත නිවාස ඉලක්කයෙන් සියයට 40 කට පමණ අර්ධ වශයෙන් හා සම්පූර්ණ වශයෙන් ආධාර ලබාදී ඇති ප්‍රතිලාභීන් ගණන 550 ක් වූයෙන් එය සම්පූර්ණ ව්‍යාපෘතියෙන් සියයට 15 ක් විය. තවද 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භයේදී ආධාරලාභීන් 6 දෙනෙකුට ලබාදුන් රු.865,000 ක මුදලක් විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිසා නැවත එය අය කර ගත යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ගණනාවකදී නිවාස අධිකාරිය දැනුවත් කළ ද අපේක්ෂා කළ පරිදි අදාළ කාර්යය ඉටුකර ගැනිමට නොහැකි විය. | |
| (ii)අධිකාරියේ ප්‍රධාන වියදම් අයිතමය ලෙස නිරීක්ෂණය වන ව්‍යාපෘති වියදම තුල ඇතුලත් විවිධ වූ උප ව්‍යාපෘති සඳහා වැය කරන වියදම් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. එම තත්ත්වය වියදම් කලමනාකරණයට බාධාවක් විය | පිළිතුරු ලබා දී නොතිබුණි. | උප ව්‍යාපෘති සඳහා නිශ්චිත හා පැහැදිලි ඇස්තමේන්තු සකස් කල යුතු වීම. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන විරුසර කාඩ්පත් සඳහා ආරක්ෂක අංශ, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා වෙනත් පෞද්ගලික ආයතන වලින් 2016 වර්ෂයේදී ලද රු.25,366,500 ක මුදලින් රු.3,607,941 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින සිට වර්ෂ හතරක කාලයක් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | විරුසර වරප්‍රසාද කාඩ්පතක වලංගු කාලය වසර 05 ක් බැවින් 2017 වර්ෂයේ නිකුත් කරන ලද කාඩ්පත් වල වලංගු කාලය 2023 වර්ෂයේදී අවසන් වීමට නියමිතය. මේ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසුව සම්පූර්ණ කාඩ්පතම එක් ස්ථානයකින් මුද්‍රණය කරන ලෙසට උපදෙස් දී ඇත. ඒ අනුව එයට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. | නිශ්චිත අරමුණත් සඳහා ලැබී ඇති මුදල් කාර්යක්ෂමව එම අරමුණ සඳහා යොදවා ගැනීමට කළමණාකාරීත්වය කටයුතු කල යුතු වීම. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේදී අධිකාරිය වෙත නිවාස ඉදිකිරීම සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 1 රූඩ් 1 පර්චස් 09 ක්වූ රු.1,500,000 කට තක්සේරු කර තිබුණු ඉඩමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අධිකාරියේ සභාපති ඇතුළු නිලධාරීන් තිදෙනෙකු විසින් මෙම ඉඩම නිරීක්ෂණය කර වාර්තාවක් ලබා දී ඇත. එම වාර්තාව අනුව මෙම ඉඩමෙන් කිසිදු ප්‍රයෝජනයක් නොමැති බවට වාර්තා කර ඇත. මෙම ඉඩම සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්තුමා දැනුවත් කර එතුමා විසින් දෙනු ලබන උපදෙස් අනුව ක්‍රියාකරන බව දන්වමි. | ඉඩම නිෂ්කාර්යව පවත්වා නොගෙන සුදුසු පරිදි උපයෝජනය කල යුතු වීම. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියෙහි අනුමත සේවක මණ්ඩලය (සභාපති සහ උප සභාපති නොමැතිව) 89 දෙනෙකි. එහෙත් 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක මණ්ඩලයේ සිවිල් නිළධාරින් 64 දෙනෙකු හා ආරක්ෂක අංශ සාමාජිකයන් 56 ක් ලෙස සමස්ථ කාර්ය මණ්ඩලය 120 ක් වූයෙන් 31 දෙනෙකුගේ අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතුණි. | 2020 වසරේ සිට ආයතනවල සියලු බඳවා ගැනිම් අත්හිටුවා ඇති බැවින් අධිකාරියේ කටයුතු අඛණ්ඩව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ආරක්ෂක අංශවලින් තවත් පිරිසක් අනුයුක්ත කර ගැනිමට සිදුවිය.මේ වන විට අධිකාරියේ උපක්‍රමිකතා සැලැස්ම (strategic Plan) සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, එය සකස් කිරීමෙන් පසු අධිකාරිය වෙත අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනා ගත හැකි වනු ඇත. ඒ අනුව ආරක්ෂක අංශ සාමාජිකයින් කොපමණ ප්‍රමාණයක් තවදුරටත් අධිකාරිය වෙත රඳවාගන්නේද යන්න තීරණය කරන බව දන්වමි. | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |